ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,479 - 2026 මාර්තු මස 06 සිකුරාදා - 2026.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	-	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	-

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 27 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 13 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

එස්. ඩී. පාඩිකෝරාළ,
රජයේ මුද්‍රණාලයාධිපති

2026 ජනවාරි මස 01 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

000 - B 82769 - (2026/03)
E - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්*පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හිරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හිරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හිරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අවණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදාවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට වරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට කැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙතවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූල්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු ඇබෑර්තු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (මූල්‍ය) - (HM 1-1)	- 01

01. තනතුරු නාමය - අධ්‍යක්ෂ (මූල්‍ය)
සේවා ගණය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" - HM 1-1
පුරප්පාඩු ගණන - 01

01.1 සුදුසුකම්

01.2 බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජවේදී යන විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබාතිබීම;

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබාතිබීම;

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබාතිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහතුන)ක පළපුරුද්දක් තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය;

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර 13ක පළපුරුද්දක් තිබීම.

01.3 අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකාර සේවා ගණයෙහි (MM 1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3 (තුන)ක අදාළ විෂයය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සමඟ

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

වයස :

අවු. : 35ට නොඅඩු හා අවු.: 55ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ඇ. **වැටුප් කේත අංකය -** HM 1-1

ඇ. **මාසික වැටුප් පරිමාණය** - HM 1-1 ක.ව.01/2025 (රු.140,640 - 15 x 4,100 - රු. 202,140/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

සැ.යු.- මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව

හා වෘත්තීය දීමනාව ක. චක්‍රලේඛ 01/2025 අනුව ලබාදේ.

මෙම තනතුර සඳහා පොදු කරුණු :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු යි.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය:

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන **www.nddcb.gov.lk** වෙත පිවිස, **"වෘත්තීන්" (https://www.nddcb.gov.lk/sinhala/careers.php)** හි දක්වා ඇති උපදෙස් පරිදි අයදුම්පත සම්පූර්ණ කර **Submit Application** කිරීමෙන් අනතුරුව එහි පිටපත බාගත කර, එම දෘඩ පිටපතට මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත අමුණා ඔබගේ සහතිකපත් වල ඡායා පිටපත් සමඟ ලියාපදිංචි තැපෑල ඔස්සේ යොමු කර යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

පත්වීමේ ස්වභාවය :

ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

අයදුම්පත් ගාස්තුව :

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ කෝපරේට් ශාඛාවේ (Corporate Branch) අංක 00001643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතු ය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

බාගත කරන ලද අයදුම්පත (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2026.03.27** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ බාගත (Download) කරන ලද අයදුම්පත හැර යොමුකරන ලද වෙනත් අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

2026 මාර්තු මස 06 දින,
383, කෝට්ටේ පාර,
රාජගිරිය.

03 - 13

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ ද්විභාෂා ලිපිකරු තනතුරේ III ශ්‍රේණිය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ III ශ්‍රේණියේ ද්විභාෂා ලිපිකරු තනතුරේ පවතින පුරප්පාඩු 15ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය:

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින්

පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත එම පරීක්ෂණයෙන් සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය ඉක්මවන අයදුම්කරුවන් අතුරින් පිළිවෙලින් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

02. සුදුසුකම්:

2.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සඳහන් **එක් සුදුසුකමක්** සපුරා තිබීම.

(i) අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව සිංහල නම් දෙවන බස දෙමළ සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම.

(ii) අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව දෙමළ නම් දෙවන බස සිංහල සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම.

(iii) අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව ඉංග්‍රීසි නම් සිංහල භාෂාව/ භාෂාව හා සාහිත්‍යය හෝ දෙමළ භාෂාව/ භාෂාව සහ සාහිත්‍යය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම;

සහ

(*ඇ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත්ව තිබීම.

2.2 කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

2.3 **වෙනත් සුදුසුකම්:**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

සටහන I : මූලික අධ්‍යාපන සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල (අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ) අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

03. වයස් සීමාව:

අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

II. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු වේ.

V. අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

05. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 45,230-10×540-11×630-10×890- 10×1,190 - රු. 78,360/- (MN 1-2025) ක් වන අතර, එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. (පරීක්ෂණයෙන් සමත්වීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය ලකුණු 35කි)

අනු. අංකය	*විෂයය*	*ලකුණු*	*උපරිම ලකුණු*
01.	**මූලික සුදුසුකම්වලට අතිරේකව ලබා ඇති භාෂා ප්‍රවීණතාවය :**		**40**
	01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ		
	I. අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව සිංහල නම්		
	(i) දෙවන බස දෙමළ		
	- A සාමාර්ථයක් සඳහා	10	
	- B සාමාර්ථයක් සඳහා	08	
	- C සාමාර්ථයක් සඳහා	05	
	(ii) ඉංග්‍රීසි භාෂාව		
	- A සාමාර්ථයක් සඳහා	10	
	- B සාමාර්ථයක් සඳහා	08	
	- C සාමාර්ථයක් සඳහා	05	
	II. අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව දෙමළ නම්		
	(i) දෙවන බස සිංහල		
	- A සාමාර්ථයක් සඳහා	10	
	- B සාමාර්ථයක් සඳහා	08	
	- C සාමාර්ථයක් සඳහා	05	
	(ii) ඉංග්‍රීසි භාෂාව		
	- A සාමාර්ථයක් සඳහා	10	
	- B සාමාර්ථයක් සඳහා	08	
	- C සාමාර්ථයක් සඳහා	05	
	III. අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව ඉංග්‍රීසි නම්		
	(i) දෙවන බස සිංහල		
	- A සාමාර්ථයක් සඳහා	10	
	- B සාමාර්ථයක් සඳහා	08	
	- C සාමාර්ථයක් සඳහා	05	
	(ii) දෙවන බස දෙමළ		
	- A සාමාර්ථයක් සඳහා	10	
	- B සාමාර්ථයක් සඳහා	08	
	- C සාමාර්ථයක් සඳහා	05	

අනු. අංකය	විෂයය	ලකුණු	උපරිම ලකුණු
	02. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාගත් අදාල භාෂා පිළිබඳ පාඨමාලාවක් සඳහා - මාස 03කට නොඅඩු - මාස 06කට නොඅඩු - අවුරුදු 01 හෝ ඊට වැඩි **(අංක 02 හි උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)**	 05 10 20	
02.	**ත්‍රෛභාෂාවෙන් කටයුතු කිරීම පිළිබඳ ලබා ඇති සේවා පළපුරුද්ද:** සේවා කාලය මාස 06කට නොඅඩු කාලසීමාවක් සඳහා ලකුණු 05 බැගින් (ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමේ දී, ත්‍රෛභාෂාවෙන් ලබා ඇති සේවා පළපුරුද්ද, තම ආයතන ප්‍රධානියා මඟින් ලබා ගත් සේවා සහතිකයකින් සනාථ කළ යුතු යි.)		**30**
03.	**තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම** රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් සඳහා - මාස 03කට නොඅඩු - මාස 06කට නොඅඩු - අවුරුදු 01 හෝ ඊට වැඩි **(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)**	 05 10 20	**20**
04.	**සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් භාෂා ප්‍රවීණතාව මැන බැලීම සඳහා විමසනු ලබන ප්‍රශ්න 05** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් භාෂා ප්‍රවීණතාවය මැන බැලීම සඳහා විමසනු ලබන ප්‍රශ්න 05ක් සඳහා, එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින්		**05**
05.	**සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා හා පෞරුෂය** I. සාමාන්‍ය දැනීම හා බුද්ධිය II. භාෂාව හැසිරවීම පිළිබඳ දැනුම III. පැහැදිළිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය	 02 02 01	**05**
06.	**මුළු එකතුව**		**100**

සටහන II - යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් සහ අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

I. අයදුම්පත් **2026.04.06** දිනට හෝ ඊට පෙර **"කොමසාරිස් ජනරාල්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සුහුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 08 දක්වාත්, දෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත්, තෙවැනි පිටුව අංක 11 සිට අංක 14 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

III. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

IV. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ද්විභාෂා ලිපිකරු තනතුරේ III ශ්‍රේණිය සඳහා අයදුම් කිරීම" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතු ය.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු.82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

VI. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත නිලධාරින් තම අයදුම්පත සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම:

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට / සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

11. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත්, ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

12. අයදුම්පත්‍රය drp.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද බාගත කළ හැකිය.

කොමසාරිස් ජනරාල්,
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව.

2026 පෙබරවාරි මස 24 වැනි දින,
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ ද්විභාෂා ලිපිකරු තනතුරේ
III ශ්‍රේණිය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය	

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4)
සටහන :- අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැකි වේ.

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/දෙමළෙන්) .....

1.2 සම්පූර්ණ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

1.3 මුලකුරු සමඟ නම : .....
(සිංහලෙන්/දෙමළෙන්) උදා - ඒ.එම්.එන්.පෙරේරා

1.4 මුලකුරු සමඟ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0 2.1 ස්ථිර ලිපිනය : .....
(සිංහලෙන්/ දෙමළෙන්) .....

2.2 ස්ථිර ලිපිනය : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

2.3 පෞද්ගලික දුරකථන අංක:

ස්ථාවර : ..... ජංගම: .....

3.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

4.0 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

5.0 අයදුම්පත් භාරගන්නා අවසාන දින වන 2026.04.06 වන දිනට වයස :
අවුරුදු : | | | මාස : | | | දින : | | |

6.0 ස්ත්‍රී/ පුරුෂ භාවය : .....

7.0 විවාහක / අවිවාහක බව : .....

8.0 ජාතිය : .....

9.0 අධ්‍යාපන සුදුසුකම්:

9.1 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය :

වර්ෂය : .....
විභාග අංකය : .....
මාධ්‍යය : .....

අනු අංකය	*විෂයය*	*ශ්‍රේණිය*
1		
2		
3		
4		
5		
6		
7		
8		
9		
10		

9.2 අ.පො.ස. උසස් පෙළ විභාගය :

වර්ෂය : .....
විභාග අංකය : .....
මාධ්‍යය : .....

අනු අංකය	*විෂයය*	*ශ්‍රේණිය*
1		
2		
3		
4		

10.0 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ යෙදී සිටින්නේ නම්,

10.1 සේවා ස්ථානය: .....
10.2 දැනට දරන තනතුර: .....
10.3 එම තනතුරට පත් වූ දිනය: .....
10.4 තනතුරේ ස්වභාවය:
ස්ථිර/ තාවකාලික/ අනියම්/ ආදේශක ද යන වග: .....

11.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? ඔව්/ නැත
ඔව් නම්, තොරතුරු සඳහන් කරන්න .....

12.0 *අයදුම්කරුගේ සහතිකය:*

i. මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
ii. මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බව දැන සිටිමි.
iii. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....,
දිනය අයදුම්කරුගේ අත්සන.

13.0 ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/ මිය/ මෙය මා පුද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිටදී ..... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.....,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :.....
තනතුර :.....
ලිපිනය :.....
දිනය :.....

14.0 **දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

(රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි)

..... මයා/ මිය/ මෙය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ස්ථිර / තාවකාලික / අනියම් ..... (තනතුර) වශයෙන් සේවය කරන බවත්, මේ තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

....
දිනය. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

03 - 23

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය

ජාතික යොවුන් සේනාංකය

2026 අධ්‍යයන වර්ෂය දෙවන කණ්ඩායම සඳහා පුහුණුලාභීන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම

දිවයින පුරා පිහිටි ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ජාලය තුළ ජීවන කුසලතා පාඨමාලාව සඳහා බඳවාගැනීම් සිදු කෙරේ. මෙම පාඨමාලාව නේවාසික නොවන පූර්ණ කාලීන නොමිලේ පවත්වන පාඨමාලාවකි. පාඨමාලා කාලය මාස 3 1/2 ක් පමණි.

පාඨමාලා සඳහා අයදුම් කිරීම :

ජාතික යොවුන් සේනාංක පුහුණු පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන පහත දක්වා ඇත. ඔබ පුහුණු වීමට අපේක්ෂා කරන මධ්‍යස්ථානය තෝරාගෙන අදාළ අයදුම්පත්‍රය පුහුණු මධ්‍යස්ථානයට ගෙනවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත දක්වා ඇති විද්‍යුත් ලිපිනයට අයදුම්පත යොමු කළ යුතු ය. අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමේ දී ලිපි කවරයේ වම්පස "2026 අධ්‍යයන වර්ෂය දෙවන අදියර" යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් කළ යුතු අතර, විද්‍යුත් තැපෑලට යොමු කිරීමේ දී විද්‍යුත් තැපෑලෙහි විෂය යන ස්ථානයට "2026 අධ්‍යයන වර්ෂය දෙවන අදියර" ලෙස සඳහන් කළ යුතු ය. 2026 මාර්තු මස 15 දින අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වේ. අදාළ අයදුම්පත්‍රය www.youthcrops.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකි ය.

වැඩි විස්තර සඳහා	- ඔබට ආසන්නතම පුහුණු මධ්‍යස්ථානය හෝ පහත දුරකතන අංකයන්ට අමතන්න.
දුරකතන අංක	- 011-2688885 / 071-0377377
ෆැක්ස් අංකය	- 011-2684784
ඊ-මේල් ලිපිනය	- application@youthcorps.lk
වෙබ් ලිපිනය	- www.youthcorps.lk
ෆේස්බුක් පිටුව	- National youth corps
ප්‍රධාන කාර්යාලය	- අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අධ්‍යක්ෂ,
ජාතික යොවුන් සේනාංකය.

නීතිඥ ආර්. නිශාන්ත පුෂ්පකුමාර,
අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය),
ජාතික යොවුන් සේනාංකය.

ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා පාඨමාලාවෙන් ලැබෙන ප්‍රතිලාභ:

i. ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා සහතිකය;
ii. ජීවන කුසලතා සඳහා ජාතික යොවුන් සේනාංක සහතිකයට අමතරව අන්තර්ජාතිකව පිළිගත් City & Guilds ආයතනය විසින් පිරිනමනු ලබන Assured Certificate in Professional Life Skills සහතිකය ලබාගැනීමේ හැකියාව (කොන්දේසි අදාළ වේ.)
iii. ක්‍රීඩා සහ කලා තරග ඉසව් සඳහා සහභාගී වීමේ අවස්ථාව (මධ්‍යස්ථාන/ පළාත් සහ ජාතික)
iv. පිළිගත් ආයතනයක වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යොමු වීම සඳහා අවස්ථාව.
v. පාඨමාලාව අවසානයේ ඔබ තෝරාගත් වෘත්තීය පුහුණුවක් සඳහා යොමු වීමට රු. 100,000.00 ක් දක්වා ශිෂ්‍යත්වයක් (කොන්දේසි අදාළ වේ.)
vi. නොමිලේ නිල ඇඳුම් සහ දෛනික පැමිණීමේ දීමනාව
vii. ධීර අභ්‍යාස පුහුණුව(Adventure Based Training)

ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා පාඨමාලාවේ සංයුතිය :

i. ජීවන කුසලතා සංවර්ධනය (Life Skills Development)
ii. මූලික ජීවන නිපුණතා සංවර්ධනය (Basic Life Competency)
iii. තොරතුරු තාක්ෂණය (Information Technology)
iv. ඉංග්‍රීසි භාෂාව (English Language)
v. කලාව සහ ජීවිතය (Art & Life)

පළාත	*අනු. අංකය*	*මධ්‍යස්ථානය*	*ලිපිනය*	*දුරකතන අංකය*
බස්නාහිර පළාත	1	කටුනායක	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ධර්මාලෝක මාවත, වලානගොඩ, කටුනායක	011-2260020
	2	යක්කල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වැරැල්ල වත්ත, යක්කල, ගම්පහ	033-2233534
	3	දිවුලපිටිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වල්පිට, දිවුලපිටිය	033-2272875
	4	බුලත්සිංහල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බුලත්සිංහල	034-2282322
	5	අත්තනගල්ල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වතුපිටිවල, අත්තනගල්ල	033-2282232
	6	රාජගිරිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අංක. 06, නාවල පාර, රාජගිරිය	011-2773989
මධ්‍යම පළාත	7	ගම්පොල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නාවලපිටිය පාර, කුඩාමකේ, ගම්පොල	081-2078177
	8	නාඋල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අරංගල, නාවුල	066-2246204
	9	නුවරඑළිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මීපිලිමාන, අඹේවෙල, නුවරඑළිය	052-2237416
	10	සෙංකඩගල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සිරිමල් උයන, ඔගස්ටාවත්ත, මහනුවර	081-2389134
	11	යටිනුවර	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මුරුතලාව පාර, පිලපිටිය	081-2410026
	12	වලපනේ	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, හරස්බැද්ද, වලපනේ	052-2050010
දකුණු පළාත	13	සූරියවැව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වෙනිවැල්ආර, සූරියවැව	047-3133800
	14	ගාල්ල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වැකුණුගොඩ, බෝපේ, ගාල්ල	091-2233182
	15	අකුරැස්ස	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාරඹේ, අකුරැස්ස	041-3131216 070-2587417
	16	වීරකැටිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නයිගල, හකුරුවෙල, වීරකැටිය	047-2257143

පළාත	අනු. අංකය	මධ්‍යස්ථානය	ලිපිනය	දුරකතන අංකය
දකුණු පළාත	17	දික්වැල්ල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඌරුගමුව, දික්වැල්ල	041-2255055
	18	නෙළුව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පියසේන ගමගේ ගොඩනැගිලි පරිශ්‍රය, ඇඹලේගෙදර, නෙළුව	070-2587416
	19	අක්මීමන	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, චීනමිත්‍ර ගම්මානය, කුරුඳුවත්ත, අක්මීමන	091-3121736
	20	ලුණුගම්වෙහෙර	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලුණුගම්වෙහෙර	047-2239292
	21	වීරවිල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වීරවිල	047-3128444
ඌව පළාත	22	බණ්ඩාරවෙල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බිඳුණුවැව, බණ්ඩාරවෙල	057-2222214
	23	මහියංගනය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාපාකඩවැව, මහියංගණය	055-2257118
	24	තණමල්විල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 3 කණුව, බෝදාගම, සූරිය ආර, තණමල්විල	055-7716006
	25	මොණරාගල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, මොණරාගල	055-2055741
	26	වැල්ලවාය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාලබෝව, වැල්ලවාය	055-2274157
	27	සියඹලාණ්ඩුව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව	070-3538292
උතුරු පළාත	28	මුලතිව්	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වඩ්ඩුවාකල්, මුලතිව්	021-2290428
	29	මන්නාරම	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, තලෛයි මන්නාරම පාර, මන්නාරම	023-2251917
	30	වව්නියාව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඉරට්ටෙපෙරියකුලම, වව්නියාව	024-2054558
වයඹ පළාත	31	කුලියාපිටිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, දෙගම්මැද, වැවගම, කුලියාපිටිය	037-2283680
	32	වාරියපොල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, උසාවිය පාර, වාරියපොල	037-2268375
	33	මාවතගම	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය,ඩෙන්වොර් වත්ත, මාවතගම	037-2298668
	34	පඬුවස්නුවර	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නුගවෙල හන්දිය, තුත්තිරිපිටිය, පඬුවස්නුවර	037-2291803
	35	දොඩම්ගස්ලන්ද	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අලකොලමඩ, දොඩන්ගස්ලන්ද	037-2252655

පළාත	අනු. අංකය	මධ්‍යස්ථානය	ලිපිනය	දුරකතන අංකය
වයඹ පළාත	36	වාලහේන	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වාලහේන, කාකපල්ලිය	032-2051991
	37	වෙන්නප්පුව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කමලසිරිමාවත, බෝලාන, වයික්කාල, වෙන්නප්පුව	031-2277199
	38	අලව්ව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විලගමුව, අලව්ව	037- 2067885
නැගෙනහිර පළාත	39	කුච්චවේලි	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සාලපේ ආරු, කුච්චවේලි	026-222 8709/ 070-2587450
	40	ගෝමරන්කඩවල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විල්පනාකුලම, ගැමුණුපුර, ගෝමරන්කඩවල	026-4549428
	41	අම්පාර	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල, උහන පාර, අම්පාර	063-2224810/ 070-2587444
	42	ත්‍රිකුණාමලය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ශ්‍රද්ධාපුර, චීන වරාය, ත්‍රිකුණාමලය	070-2587421/ 026-4549432
	43	දෙහිඅත්තකණ්ඩිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලිහිණියාගම, දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය	027-2056723
	44	වාලච්චෙන	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 18 වන සැතපුම් කණුව, කල්කුඩා, වාලච්චේන	065-3121085/ 070-3964998
	45	සේරුවාවිල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය,සේරුවිල සිරිදූව, සේරුනුවර	026-4549439/ 070-2587443
සබරගමුව පළාත	46	කෑගල්ල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මාවත, ගංගොඩවත්ත, කෑගල්ල	035-2223260
	47	නිවිතිගල	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අම්බලන්දෙනිය, වටාපත පාර, නිවිතිගල	045-2279970
	48	ගලිගමුව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ආසියාදෙනිය, ගලිගමුව	035-2282993
	49	ඇඹිලිපිටිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගම්උදා භූමිය, යෝධගම, ඇඹිලිපිටිය	047-2262399
	50	බලංගොඩ	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බටුගම්මන, බලංගොඩ	077-6218530
	51	දෙහිඕවිට	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කනංගම, දෙහිඕවිට	036-2267671

පළාත	අනු. අංකය	මධ්‍යස්ථානය	ලිපිනය	දුරකතන අංකය
උතුරුමැද පළාත	52	කැකිරාව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහවැලි සංකීර්ණය, ඔළුකරඳ, කැකිරාව	025-2263297
	53	ගලෙන්බිඳුණුවැව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මොගොඩවැව, යක්කල	025-2258355
	54	කලාවැව	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගල්නැව, බුල්නැව, කලාවැව	025-2269946
	55	අනුරාධපුරය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාලඩිකුලම්, අනුරාධපුරය	070-2587432 025-3852809
	56	මැදිරිගිරිය	ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාය 03, නව නගරය පාර, මැදිරිගිරිය	027-2050477

03-20

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය

(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.)

පාසල් උපදේශනය සහ ශිෂ්‍ය ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව
2026 (ප්‍රථම කණ්ඩායම - ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ පාසල් උපදේශනය සහ ශිෂ්‍ය ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා පාසල් උපදේශනය සහ ශිෂ්‍ය ආරක්ෂණය පිළිබඳ පුළුල් දැනුමක් ලබාගැනීමට හෝ පාසල් උපදේශන ක්ෂේත්‍රය හරහා උසස් ජාතික ඩිප්ලෝමා අදියරය දක්වා සිය වෘත්තීය දැනුම වර්ධනය කරගැනීම සඳහා උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකියි.

සුදුසුකම් :

රාජ්‍ය අංශයේ ප්‍රාථමික, ද්විතීයික සහ පශ්චාත් ද්විතීයික පාසල් සඳහා ගුරු පත්වීම් ලබා සේවයේ නියුතු ගුරුවරුන්/ පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් අංශයේ ගුරු පත්වීම් ලබා සේවයේ නියුතු ගුරුවරුන් සඳහා පමණක් විවෘත ව පවතියි.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට මෙම පාඨමාලාව සඳහා කිසිදු වයස් සීමාවකින් තොරව ඉල්ලුම් කළ හැකි ය.

පාඨමාලාවේ ස්වභාවය : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය).

මාධ්‍ය : සිංහල හෝ ඉංග්‍රීසි

පාඨමාලා කාලය:

එක් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාවකි. සජීවී දේශන, පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : මුළු පාඨමාලා ගාස්තුව රු. 30,000.00 කි.

පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1,000.00 ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.

රු. 30,000.00 ක මුදල එකවර හෝ රු. 2,500.00 බැගින් දොළොස් මාසිකව ගෙවිය හැකි ය.

පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :

අයදුම්කරු විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
2. ගුරු පත්වීම් ලිපියේ ඡායාරූපය.

070-4191660 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය : 2026.04.17 වේ.

වැඩි විස්තර සඳහා : කාර්යාලයීය වේලාවන් වන **පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා** 032-3137500 දුරකථන අංකය ඔස්සේ මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව අමතා විමසිය හැකි ය.

ප්‍රධානී - මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා විත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන
විවෘත විද්‍යායතනය.

03 - 58

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

2026/2027 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මගින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙහි නියුතුවන්නන්ගේ හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත එකම රාජ්‍ය ආයතනය වේ.

2026/2027 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් පාඨමාලා ද්විත්වයට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. වැවිලි ව්‍යාප්තිකරණ කළමනාකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - (NVQ අදියර 05)

කාලසීමාව	-	අවුරුදු 2 යි (50% මාර්ගස්ථව ද, 50% ආයතනයේ දී සති අන්ත දේශන වශයෙන් ද පවත්වනු ලැබේ.)
මාධ්‍යය	-	ඉංග්‍රීසි/ සිංහල
පාඨමාලා ගාස්තුව	-	රු. 165,000.00

ඇතුළත් වීමේ සුදුසුකම් :

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනක් (03) සමත් වීම;

හෝ

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

02. වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - (NVQ අදියර 05)

කාලසීමාව	-	අවුරුදු එකයි මාස හයයි. අදියර I - අවුරුදු 01 ක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාව අදියර II - මාස 06 ක ප්‍රායෝගික පුහුණුව
මාධ්‍යය	-	ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව	-	රු. 165,000.00

ඇතුළත්වීමේ සුදුසුකම් :

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනක් (03) සමත් වීම;

හෝ

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

අයදුම්කරන ආකාරය :

මෙම වැඩසටහන සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 මාර්තු මස 20 හෝ ඊට පෙර පහත දක්වා ඇති ආකෘතියෙන් අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, M.D.H. ජයවර්ධන මාවත, අතුරුගිරිය, ශ්‍රී ලංකාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ www.nipm.gov.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා :

070-6645133
077-6441028
0112770232

NATIONAL INSTITUE OF PLANTATION MANAGEMENT

APPLICATION FOR ADMISSION

FM/TR/03

Name of the Programme :

Name in Full : Mr. /Mrs./ Miss./ Dr. / Prof. (Use BLOCK LETTERS) :

Name with initials :

Permanent Address :

Tele. No.:

Mobile No.:

E-mai:

National Identity card No.:

Marital Status

Single

Married

Date of Birth

Date	Month	Year

EDUCATIONAL QUALIFICATIONS

G.C.E. (O/L) Examination

Subject	*Grade*	*Year*

Employer :

Designation :

Official address :

Tele. No.:

Fax No.:

G.C.E. (A/L) Examination

Subject	*Grade*	*Year*

COURSE COMPLETED AT THE NIPM

Course	*Year*

PROFESSIONAL QUALIFICATIONS

Institute	*Period*	*Qualification*	*Year*

WORK EXPERIENCE

Organization	*Period*	*Designation*	*Year*

FINANCE

How will you finance your professional studies at the institute?

Self ☐ Sponsored ☐

If sponsored, by whom?

....

Date Signature of the Sponsor

I hereby certify that the particulars furnished by me in this application are true & accurate and agree to abide by the rules and regulations governing the above course.

....

Date Signature of the Applicant

Payments Procedure for the programmes

Payments can be made to the credit of NIPM Current Account No. 3697566 maintain at any branch of Bank of Ceylon (BOC)and the printed "Customer Deposit Slip" should be forwarded to NIPM, Athurugiriya in order to obtain official receipt for payment.(Name to be written in bank deposit slip for identification of the payee)

03-59

ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

මාසය	*පළ කිරීමේ දිනය*		*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*			
			2026 වර්ෂය			
පෙබරවාරි	2026.02.06	සිකුරාදා	2026.01.23	සිකුරාදා	දහවල්	12.00
	2026.02.13	සිකුරාදා	2026.01.30	සිකුරාදා	දහවල්	12.00
	2026.02.20	සිකුරාදා	2026.02.06	සිකුරාදා	දහවල්	12.00
	2026.02.27	සිකුරාදා	2026.02.13	සිකුරාදා	දහවල්	12.00
මාර්තු	2026.03.06	සිකුරාදා	2026.02.20	සිකුරාදා	දහවල්	12.00
	2026.03.13	සිකුරාදා	2026.02.27	සිකුරාදා	දහවල්	12.00
	2026.03.20	සිකුරාදා	2026.03.06	සිකුරාදා	දහවල්	12.00
	2026.03.27	සිකුරාදා	2026.03.13	සිකුරාදා	දහවල්	12.00
අප්‍රේල්	2026.04.02	බ්‍රහස්පතින්දා	2026.03.20	සිකුරාදා	දහවල්	12.00
	2026.04.10	සිකුරාදා	2026.03.27	සිකුරාදා	දහවල්	12.00
	2026.04.17	සිකුරාදා	2026.04.02	බ්‍රහස්පතින්දා	දහවල්	12.00
	2026.04.24	සිකුරාදා	2026.04.10	සිකුරාදා	දහවල්	12.00
	2026.04.30	බ්‍රහස්පතින්දා	2026.04.17	සිකුරාදා	දහවල්	12.00

එස්. ඩී. පාඩිකෝරාළ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 ජනවාරි මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.